හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

කාරක සභාව පැවැත්වූ දිනය 2017-07-25

<u>අටවන පාර්ලිමේන්තුවේ පළමුවන සැසි වාරය</u>
<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>

**<u>2017 ජූලි මස 25 වන දින ප.ව. 2.30ට කාරක සභා කාමර අංක 05 පැවැති</u>**
**<u>97 වන රැස්වීම</u>**

**<u>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය</u>**

| | සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය සහ ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | <u>අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය</u><br><br>ආයතනයේ පනතට අනුව කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා, පාලක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වුවත් රාජ්‍ය අමාත්‍යතුමාගේ ලේකම්වරයා එහි සභාපති වරයා ලෙස කටයුතු කිරීම පිළිබඳ කාරක සභාව විසින් විමසන ලදී.<br><br>2016 සැප්තැම්බර් 26 දින අංක 1986/6 අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය සම්බන්ධ විෂය රාජ්‍ය කෘෂිකර්ම අමාත්‍යවරයා යටතට පවරා ඇති බැවින් මෙම සභාපති ධූරය සඳහා රාජ්‍ය ලේකම්වරයා පත්කර අති බව අමාත්‍යාංශ ලේකම් පවසන ලදී. | ඉදිරියේදී ප්‍රශ්න ඇතිවීම වළක්වා ගැනීම සඳහා මේ පිළිබඳ නීතිමය තත්ත්වය නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසා බැලීම. | නීතිපති මගින් ලබාදී තිබූ උපදෙස් අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා පාළක මණ්ඩලයේ සභාපති ලෙස මේ වනවිට කටයුතු කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| 02 | **<u>අභ්‍යන්තර විගණන කමිටුව ක්‍රියාත්මක නොවීම</u>**<br><br>අභ්‍යන්තර විගණන අංශයේ වැඩ කටයුතු සිදු නොවීම නිසා මාස 06 කට ආසන්න කාලයක් තුල කිසිදු විගණන විමසුමක් නිකුත් කර නොතිබීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.<br><br>2017 වසර ආරම්භයේදී අභ්‍යන්තර විගණක වරිය සම්බන්ධයෙන් ගැටලුවක් මතුවීම හේතුවෙන්, පරීක්ෂණයක් පවත්වන තුරු ඇයව සේවයෙන් නිදහස් කර ඇති බවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාව මේ වන විට ලැබී ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බවත් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී පැවසීය. | මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කොට අවශ්‍ය පියවර ගැනීම | අභ්‍යන්තර විගණක සම්බන්ධයෙන් 2017 වර්ෂයේ මතුවූ ගැටලුවක් (විෂමාචාරයක්) පිළිබඳව අමාත්‍යාංශය මගින් පවත්වන ලද පරීක්ෂණයට අමතරව 2018 වර්ෂයේ විධිමත් ඒක පුද්ගල පරීක්ෂණයක් ද පවත්වා ඇත. එහි නිරීක්ෂණ හා නිගමනයන්ට අනුව අභ්‍යන්තර විගණක නිළධාරිනියට එරෙහිව එල්ල වී තිබූ චෝදනා නිරීක්ෂණය කර එම නිරීක්ෂණ හා නිගමනයන් 2018 ඔක්තෝබර් මස පවත්වන ලද පාලක මණ්ඩලය වෙත අංක 367 යටතේ පාලක මණ්ඩල පත්‍රිකාවක් සකස් කර සුදුසු විනය ක්‍රියාමාර්ගයක් ලබාගැනීම සඳහා යොමු කර ඇත.<br><br>පාලක මණ්ඩල තීරණය අනුව ඇය වෙත තරයේ අවවාද ලිපියක් නිකුත් කර එහි පිටපතක් ඇයගේ පෞද්ගලික ගොනුවට ඇතුලත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.<br><br>ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කර මෙම ගැටලුව නිරාකරණය කර ඇති අතර යථා පරිදි ඇය විසින් විගණන විමසුම් මේ වනවිට සිදුකරමින් සිටියි. |

| | | | |
|---|---|---|---|
| 03 | <u>**විදේශ ශිෂ්‍යත්වලාභීන් ගිවිසුම් කඩ කිරීම**</u><br><br>විදේශ විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ ගිවිසුම් කඩ කළ ශිෂ්‍යත්වලාභීන්ගෙන් අය විය යුතු මුදල්වල වටිනාකම රු.15,992,125/- ක් ව පැවතීම පිළිබඳ සභාව විමසන ලදී. | මේ වන විට ඉතිරිව ඇත්තේ ශිෂ්‍යත්වලාභීන් 10 දෙනෙකු පමණක් බවත් ඉන් දෙදෙනෙකු ගෙවීම් සම්බන්ධයෙන් සමථයකට පත්ව ගෙවීම් කරගෙන යන අතර තවත් දෙදෙනෙකු පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීමෙන් අනතුරුව ආයතනයට පක්ෂපාතී ලෙස තීන්දුව ලැබී ඇති බවත් ඉතිරිව ඇති හයදෙනාගෙන් මුදල් අයකර ගැනීම සඳහා උපායශීලී ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බවත් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී පැවසීය. | විදේශ ශිෂ්‍යත්වලාභීන් 09 දෙනෙකුගෙන් රු.15,387,897.91 ක ශේෂයක් අයකර ගැනීමට 2018-12-31 දිනට පවතී.<br><br>මෙම විදේශ ශිෂ්‍යත්වලාභීන් 09 දෙනාගෙන් ණයගැතියන් දෙදෙනෙකුගෙන් ඇපකරුවන්ගෙන් අයවෙමින් පවතී. එක් විදේශ ශිෂ්‍යත්වලාභියෙකු වන ඒ.සී.කේ. සේපාල මිය වාරික වශයෙන් 2018 ජනවාරි දක්වා ගෙවා ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට නීතිපතිවරයා විසින් ඒ.සී.කේ. සේපාල මිය වෙත සිහි කැඳවීමක් යොමුකර ඇත.<br><br>ගාමිණී වික්‍රමසිංහ මහතාගෙන් රු.5,226,878.10 ක් විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂ අයකර ගැනීමට පවරා තිබූ නඩුව ආයතනයට වාසිදායක ලෙස නඩු තීන්දුව ලබා දී ඇත. මෙම මුදල ඔහුගෙන් අයකර ගැනීමට රිට් අඥාවක් ලබා ගැනීමට නීතිපති වෙත යොමුකර ඇත.<br><br>මෙම විදේශ ශිෂ්‍යත්ව ණය ගැතියන්ගේ විස්තර ඇතුලත් කර පුවත්පත් දැන්වීමක් ප්‍රසිද්ධ කරන ලෙස 370 වෙනි පාළක මණ්ඩලයේදී තීරණය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 04 | <u>**අධ්‍යක්ෂක නිල නිවාසය බාහිර පාර්ශවයක් පරිහරණය කිරීම**</u><br><br>අධ්‍යක්ෂක නිල නිවාසය, නිල නිවාස කුලිය අය කර ගැනීමෙන් තොරව හා අනුමැතියක් රහිතව බාහිර පාර්ශවයකට පදිංචියට ලබා දී තිබීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.<br><br>2015 වසරේ අධ්‍යක්ෂවරයා නිල නිවාසයේ පදිංචිව නොසිටීම නිසා අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු හට තාවකාලිකව එය ලබා දී ඇති අතර මේ වනවිට නිල නිවාසය නිදහස් කර දෙන ලෙස ඔහුට දැනුම් දී ඇති බව අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී පැවසීය. | හැකි ඉක්මනින් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීම | අධ්‍යක්ෂ නිල නිවාසයේ පදිංචිවී සිටි බාහිර පාර්ශවය මේ වනවිට ඉවත්වී ඇති අතර පදිංචිවී සිටි කාලයට අදාල නිවාසකුලී, දුරකථන බිල්පත්, විදුලි බිල්පත් හා ජල බිල්පත් වලට අදාල සියලුම ගාස්තු අයකරගෙන ඇත. |
| 05 | <u>**පරිගණක මිලදී ගැනීම**</u><br><br>තාක්ෂණික කමිටුව ප්‍රතික්ෂේප කළ ආයතනයකින් 2015 වර්ෂයේදී රු. මිලියන 1.7ක් වැය කර පරිගණක 17 ක් මිලදී ගැනීම සහ එම පරිගණකවල දෝෂයන් හා සේවා කොන්ත්‍රාත්වලට අනුව නියමිත කාලය තුල සේවා කටයුතු කර නොතිබීම පිළිබඳව කාරක සභාව විසින් විමසීමක් කරන ලදී.<br><br>ආයතනයේ ලේඛකාධිකාරීවරයාගේ නිර්දේශය මත මෙම මිලදී ගැනීම සිදු කළ බව අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී පැවසීය.<br><br>ආයතනය තුල තාක්ෂණ කමිටුවත් තිබියදීත් බාහිර පාර්ශව විසින් මෙම මිලදී ගැනීම් පිළිබඳ තිරණ ගැනීම ගැන කාරක සභාව සිය නොසතුට පල කළාය.<br><br>ඉදිරියේදී මෙවන් තත්ත්වයක් ඇති නොවීමට වග බලා ගන්නා බව අමාත්‍යාංශ ලේකම් විසින් පවසන ලදී. | මේ පිළිබඳ වාර්තාවක් සති 02ක් ඇතුළත කාරක සභාව වෙත යොමු කිරීම. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත මෙම පරිගණක මිලදී ගන්නා ලදී. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නීති රීති වලට අනුකූලව අප ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| 06 | <u>කාබනික පොහොර භාවිතය</u><br><br>හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය මගින් සිදුකරනු ලබන්නේ කෘෂි පර්යේෂණ (Agrarian Research) පමණක් බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් තාක්ෂණික පර්යේෂණ (Technical Research) සිදු කරනු ලබන බවත්, මේ වන විට රසායනික පොහොර අඩුවෙන් කාබනික පොහොර සමඟ යෙදීම සුදුසු බවට ජනතාව දැනුවත් කර ඇති බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැවසීය.<br><br>ක්‍රම ක්‍රමයෙන් ජනතාව රසායනික පොහොර භාවිතයෙන් දුරස් කොට කාබනික පොහොර වෙත නැඹුරු කිරීම සඳහා වන විද්‍යාත්මක පර්යේෂණ මේ වනවිට සිදු කරමින් පවතින බවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තවදුරටත් පැවසීය. | | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික පර්යේෂණ සිදුකරන ආයතනයකි. එබැවින් මෙම ආයතනය කෘෂිකර්ම තාක්ෂණික පර්යේෂණ (Technical Research) සිදු කරන්නේ නැත.<br><br>කාබනික පොහොර ක්ෂේත්‍රය සම්බන්ධව සමාජ ආර්ථික පර්යේෂණ වාර්තා තුනක් මෙම ආයතනය විසින් සිදුකර ඇත.<br><br>එම පර්යේෂණයන්හි මාතෘකා පහත සඳහන් පරිදි වේ.<br><br>1. කාබනික පොහොර භාවිතයේ ඇති විභවතා සහ ගැටළු : සිංහල පර්යේෂණ වාර්තාව - 2009<br><br>2. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය : සිංහල පර්යේෂණ වාර්තාව - 2012<br><br>3. Municipal Solid Waste Composting : Potentials and Constraints : English Report - 2015 |